046

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන

පස්වන මට්ටම/හයවන මට්ටම - 2021/2022

අවසාන පරීක්ෂණය 2022

**STU5415/STU6315** - අධ්‍යාපන කළමනාකරණය

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.11.26 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1** වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, **2** වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට **(03)** ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "කාර්යක්ෂමතාව" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන මූලිකාංග හතර (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. බලය සහ අධිකාරිය වෙන් කර දක්වන්න.

04. ඵලදායී පාසලක් හඳුනාගත හැකි නිර්ණායක පහක් (05) සඳහන් කරන්න.

05. F.W.Taylor විසින් හඳුන්වා දුන් විද්‍යාත්මක කළමනාකරණ න්‍යායේ මූලධර්ම හතරක් (04) සඳහන් කරන්න.

06. විදුහල්පතිවරුන් හා අධ්‍යාපන නිලධාරීන් පුහුණු කිරීමේ අවශ්‍යතාව කරුණු දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකරණයෙහි පවතින ගැටලු හතරක් (04) සඳහන් කරන්න.

08. අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ දැනුම, පාසල් ගුරුවරයෙකුට වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ සංවිධාන ව්‍යුහය ඇඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

ii. "අධ්‍යාපන කළමනාකරණය" හා "අධ්‍යාපන පරිපාලනය" අතර වෙනස උදාහරණ දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ඉහත (i) හි ඔබ විසින් දක්වන ලද ව්‍යුහයේ තලයන් හතරක (04) වැදගත්කම හා ඊට අදාළ ප්‍රධාන කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. i. මැක්ස් වෙබර් විසින් ඉදිරිපත් කරන ලද නිලබලතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. පාසල් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා එහි අදාලත්වය සඳහන් කරන්න. (ලකුණු 10)

11. i. ඵලදායී පාසලක ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

ii. "අභ්‍යන්තර කාර්යක්ෂමතාව" හා "බාහිර කාර්යක්ෂමතාව" යන්න වෙන්කර හඳුන්වන්න. (ලකුණු 08)

iii. වර්තමාන පාසල් පද්ධතියේ ඵලදායිතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා ඔබගේ යෝජනා හතරක් (04) දක්වන්න. (ලකුණු 08)

12. i. "පන්ති කළමනාකරණය" යන්නෙන් අදහස් වන්සේ කුමක් ද? (ලකුණු 04)

ii. නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු ලෙස "යහපත් පන්ති කළමනාකරණයක්" පැවතීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 08)

iii. නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු විසින් පන්ති කාමර කළමනාකරණයේ දී මුහුණ දෙන්නා වූ ගැටලු හතරක් (04) සඳහන් කර ඒවා මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. i. "නායකයා" සහ "කළමනාකරුවා" අතර වෙනස සංසන්දනය කරන්න. (ලකුණු 04)

ii. ඔබ විසින් අධ්‍යයන කරන ලද ඕනෑම නායකත්ව න්‍යායක අඩංගු ප්‍රධාන කරුණු සඳහන් කරන්න. (ලකුණු 08)

iii. පාසලේ නායකයා ලෙස විදුහල්පතිවරයෙකුට ඇරීමට සිදුවන විවිධ භූමිකා විභාග කරන්න. (ලකුණු 08)

14. පහත මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

i). පාසල තුල ගැටුම් කළමනාකරණය

ii). පන්තිකාමර විනය

iii). පාසල් පාදක කළමනාකරණය

iv) හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) විසින් ඉදිරිපත් කල කළමනාකරුවාගේ භූමිකා (ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.